කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

ශාස්ත්‍රවේදී විශේෂ උපාධි පරීක්ෂණය (භූගෝල විද්‍යාව) - දෙවන භාගය

දෙවන සෙමෙස්තර අවසාන පරීක්ෂණය - 2018/2019

# GYG 3263 - වෛද්‍ය භූගෝල විද්‍යාව

පැ දෙකයි (02)

ප්‍රශ්න **තුනකට (03)** පමණක් පිළිතුරු සපයන්න.

---

1. i. විවිධ වර්ගයේ රෝග කාරක මොනවාද? (ලකුණු 04)

   ii. වර්තමාන ලෝකයේ ප්‍රධාන වශයෙන් හඳුනාගෙන ඇති ආසාදන රෝග පහක් නම් කරන්න. (ලකුණු 04)

   iii. ආසාදන රෝග කෙරෙහි වැඩි වශයෙන් හේතු වන පාරිසරික සාධක සාකච්ඡා කරන්න. (ලකුණු 12)

2. i. දරිද්‍රතාවයේ ප්‍රධාන කොටස් නම් කරන්න. (ලකුණු 02)

   ii. දරිද්‍රතා චක්‍රයෙහි මූලික සංරචක නම් කරන්න. (ලකුණු 06)

   iii. "රටක මානව සෞඛ්‍ය කෙරෙහි දරිද්‍රතාව සෘජුව බලපෑම් කරයි" මෙම අදහස විවේචනාත්මක ව විග්‍රහ කරන්න. (ලකුණු 12)

3. i. රටක මානව සෞඛ්‍ය තත්ත්වයෙහි ගුණාත්මක බව නිරූපණය කෙරෙන සෞඛ්‍ය දර්ශක නම් කරන්න. (ලකුණු 04)

   ii. ඔබ විසින් 3.(i) හි දක්වන ලද දර්ශකවල සාධනීය බව කෙරෙහි බලපා ඇති හේතු ශ්‍රී ලංකාව ඇසුරෙන් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

   iii. මානව සෞඛ්‍ය තත්ත්වය ප්‍රවර්ධනයෙහිලා ප්‍රාථමික සෞඛ්‍ය ආරක්ෂණයෙහි ඇති වැදගත්කම නිදසුන් සහිතව කෙටියෙන් විමසන්න. (ලකුණු 08)

4. i. ලෝක සෞඛ්‍ය සංවිධානයට අනුව "සෞඛ්‍ය පද්ධතිය" යන්න නිර්වචනය කරන්න .

(ලකුණු 03)

ii. සෞඛ්‍ය පද්ධතියක මූලිකාංග පැහැදිලි කරන්න.

(ලකුණු 05)

iii. ගුණාත්මක බවින් ඉහළ සෞඛ්‍ය පද්ධතියක් ස්ථාපිත කිරීමෙහිලා ගත හැකි ක්‍රියාමාර්ග නිදසුන් සහිතව කෙටියෙන් විග්‍රහ කරන්න.

(ලකුණු 12)

5. i. වර්ෂණයේ ආන්තික තත්ත්ව හේතුවෙන් ඇති විය හැකි ප්‍රධාන සෞඛ්‍ය ගැටලු දක්වන්න.

(ලකුණු 05)

ii. ගෝලීය උණුසුම්වීම මානව සෞඛ්‍ය කෙරෙහි ඇති කරන සෘජු බලපෑම් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 07)

iii. දේශගුණ වෙනස්වීමෙහි සමාජ-ආර්ථික බලපෑම් මානව සෞඛ්‍ය කෙරෙහි කෙසේ හේතු වන්නේදැයි කෙටියෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

6. i. ප්‍රාථමික සෞඛ්‍ය අධ්‍යාපනය යනුවෙන් ඔබ අදහස් කරනුයේ කුමක්ද?

(ලකුණු 05)

ii. ප්‍රාථමික පාසැල්වල සෞඛ්‍ය අධ්‍යාපනය සඳහා ඇතුළත් කිරීමට අවශ්‍ය ප්‍රධාන මූලිකාංග දක්වන්න.

(ලකුණු 05)

iii. පාරිසරික සෞඛ්‍ය උපද්‍රව වළක්වාලීම සඳහා වැඩිහිටි සෞඛ්‍ය අධ්‍යාපනයේ ඇති වැදගත්කම සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

••••••••••••••••••••••